# තනතුරු - ඇබෑර්තු

## හැටන් දික්ඔය නගර සභාව

හැටන් දික්ඔය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරු සඳහා දෛනික පදනමින් සේවයට යොදවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති හැටන් දික්ඔය නගර සභා බලප්‍රදේශයේ වසර 03 කට වැඩි කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *සේවක ගණය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා පදනම* | *දෛනික වැටුප් ගෙවීමේ පදනම* |
|---|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 20 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| 02. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 08 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |

01. මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන ගණයට අදාළ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *කාර්යය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය කම්කරු | 20 | මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, කසළ එකතු කර කසළ ප්‍රවාහන රථවලට දැමීම, පොදු වැසිකිළි හා කැසිකිළි පවිත්‍ර කිරීම, පොදු ස්ථාන ඇමදීම යන කාර්යයන් ඇතුළුව පිරිසිදු කිරීමේ කාර්යයන්, ආයතනයේ සහ වැසිකිළි අවට පරිසරය පවිත්‍රව තබාගැනීම. | අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එකවරකදී සමත්ව තිබිය යුතුය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවල 5 ශ්‍රේණිය සමත් අයවළුන් සේවයේ යෙදවීමට කටයුතු කරනු ලැබේ. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 08 | පළාත් පාලන ආයතන සතු ක්‍රීඩාපිටි, මාර්ග හා විවෘත පරිශ්‍රයන් ශුද්ධ පවිත්‍ර කිරීම සහ මාර්ගවලට අදාළ කාණු හා බෝක්කු ශුද්ධ පවිත්‍ර කිරීම. කර්මාන්ත අංශයට අදාළ කටයුතු. | |

1.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර :

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| **මුළු ලකුණුවල එකතුව** | **100** | |

| **2.** | **බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :** |
|---|---|
| I. | අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. |
| II. | අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය. |

| | |
|---|---|
| III. | සෑම අයදුම්කරුවෙකුම තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |
| IV. | අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. |
| V. | අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය. |
| VI. | රජයේ/ පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබුවකු නොවිය යුතුය. |
| VII. | තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |
| VIII. | මෙම බඳවා ගැනීම සඳහා සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |
| XI. | අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන කාල සීමාව අතුරතුර කාලයේදී මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය හැටන් දික්ඔය නගර සභාවේ ලේකම් සතු වේ. |
| X. | මෙය ස්ථිර සේවයේ කිසිදු පත්වීමක් ලැබීම සඳහා හිමිකමක් නොවන අතර, මෙය හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් සිදුකරන බඳවාගැනීමකි. |

05. බඳවා ගැනීමේ ක්‍රමය :

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් බඳවා ගැනේ.

II. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. අයදුම් කළ යුතු ආකාරය :

අයදුම්කරුවන් මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2026 සැප්තැම්බර් 30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, හැටන් දික්ඔය නගර සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එක් අයදුම්කරුවෙකු තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් ඒ ඒ තනතුරු සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය :

1. උප්පැන්න සහතිකය
2. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත
3. අධ්‍යාපන සහතික
4. ශිල්පීය නිපුණතා/ ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය
5. පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය.
6. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (01 ක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
7. පොලිස් වාර්තාව

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදනයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවති නම්, සිංහල නිවේදනය අනුව අදාළ කරුණු බල පැවැත්වේ.

එච්. ජී. එස්. ඩී.රූපසිංහ,
ලේකම්,
හැටන් දික්ඔය නගර සභාව.

2026 අගෝස්තු මස.19 වන දින,
හැටන් දික්ඔය නගර සභාව,
හැටන්.